# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012
2015 සැප්තැම්බර් / ඔක්තෝබර්

දර්ශනය - PHIL –E 1015
දාර්ශනික ගැටලු

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි                                                    කාලය : පැය 03 යි

---

01. 'දර්ශනය මනුෂ්‍ය ජීවිතයේ ප්‍රශ්න පිළිබඳව අවධාරණය කරයි" සාකච්ඡා කරන්න.

02. පාරභෞතික ගැටලුව විසඳන්නට විද්‍යාවට හැකිවේ යැයි ඔබ සිතන්නේ ද? සුදුසු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

03. බුද්ධිවාදය සමඟ සසඳමින් අනුභූතිවාදයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂාවට ලක්කරන්න.

04. සත්‍ය පිළිබඳ ආනුරූප්‍යතාවාදය සම්බන්ධයෙන් මතුවන ප්‍රධාන ගැටලු පිළිබඳව අවධාරණය කරමින් එම වාදය ඇගයීමට ලක්කරන්න.

05. ඔබ ඥානය විශ්වාසයෙන් වෙන් කර දක්වන්නේ කෙසේ ද? ඥානය සඳහා පැවතිය යුතු අවශ්‍ය සහ සෑහෙන තත්ත්වයන් ඇසුරෙන් පරීක්ෂා කරන්න.

06. විශ්ව නිර්මාණය සම්බන්ධ දාර්ශනික සහ විද්‍යාත්මක විමර්ශනයන් විචාරයට ලක් කරන්න.

07. ඉන්ද්‍රිය අනුභූතිය ඇසුරෙන් භෞතික වස්තූන්ගේ පැවැත්ම සාධනය කළ හැකි ද? සාකච්ඡා කරන්න.

08. හේතුඵලවාදය දාර්ශනික ගැටලුවක් වශයෙන් සැලකෙන්නේ මක්නිසා ද? පිළිතුරට හේතු දක්වන්න.

09. දෙවියන් වහන්සේ පවතින සේක් ද? උදාහරණ ඇසුරෙන් පක්ෂව හෝ විපක්ෂව තර්ක කරන්න.

10. භාෂා විශ්ලේෂණය ඇසුරෙන් දාර්ශනික ගැටලු නොපෙනී යනු ඇතැයි ඔබ සිතන්නේ ද? පිළිතුරට උදාහරණ දක්වන්න.

**************************